# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/34 - 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2016.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

ප්‍රති අපනයනය කිරීමේ පදනම මත ආනයනය කරන ලද යන්ත්‍ර හා උපකරණ අපහරණය සඳහා 2003 අංක 02 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනය යටතේ රේගු වටිනාකම තීරණය කිරීමේ ක්‍රමය

රජයේ අනුමැතිය ලත් විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රති අපනයනය කිරීමේ පදනම මත ආනයනය කරන ලද, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක පද්ධතියේ 84 වන පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කරන ලද පහත උපලේඛනය I හි දක්වා ඇති යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් අපහරණය සඳහා රේගු වටිනාකම තීරණය කිරීමේ ක්‍රමයක් 2003 අංක 02 දරන රේගු (සංශෝධිත) පනතේ 'ඉ' උපලේඛනයේ දක්වා ඇති විධිවිධාන අනුව මෙමඟින් ස්ථාපනය කෙරේ.

ඒ අනුව, රජයේ අනුමැතිය ලත් රජයේ විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රති අපනයනය කිරීමේ පදනම මත ආනයනය කරන ලද පහත උපලේඛනය I හි දක්වා ඇති යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් අපහරණය සඳහා වන රේගු වටිනාකම තීරණය කරනු ලැබීමේ ක්‍රමයක් ස්ථාපනය කරනු ලබන්නේ එකී යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් භාවිතා කරනු ලැබූ කාලය පදනම් කර ගෙනය.

**උපලේඛනය I**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක පරිච්ඡේදය | විස්තරය | ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලැබූ කාලය | අපහරණය සඳහා රේගු වටිනාකම |
|---|---|---|---|
| 84 වන පරිච්ඡේදය | යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් | වසර 10 ක් හෝ ඊට වඩා පැරණි | මී. ර. ගැ. වටිනාකමින් 10% |
| | | වසර 5 ට වැඩි වසර 10 ට අඩු | මී. ර. ගැ. වටිනාකමින් 50% |
| | | වසර 1 ට වඩා වැඩි වසර 5ට වඩා අඩු * | මී. ර. ගැ. වටිනාකමින් 60% |

1A - PG 3091 — 157 (2016/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

* මුදල් අමාත්‍යාංශය මගින් අනුමත කරනු ලැබුයේ නම්, ප්‍රති අපනයනය කිරීමේ පදනම මත ආනයනය කරන ලද එක් වසරක හෝ වසර එකකට වඩා අඩු කාලයක් භාවිතා කරනු ලැබූ යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ ආනයනය කරන කාලයේ දී පවත්නා තීරු බදු අපහරණය කළ හැක්කේ ය.

භාවිතා කරනු ලැබූ කාලය ගනණය කිරීම සඳහා අදාළ යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද දිනය හා ඒවා අපහරණය කරන ලද දිනය අතර කාලය සලකා බලනු ලැබේ.

එකී යන්ත්‍ර හා යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් අපහරණය කරන අවස්ථාවේ දී ගෙවිය යුතු බද්ද එකී යාන්ත්‍රික උපකරණ හා ඒවායේ කොටස් ආනයනය කරන ලද අවස්ථාවේ දී පැවති බදු පදනම අනුව ගණනය කළ යුතු ය.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

09 - 533

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.